# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/20/2020 (NPC)**

කේ.ආර්.වීරසිරි

**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2026.02.24**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.

අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක එච්.ඩබ්. සෝමරත්න මහතා.

වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා**

කහවලගේ රංජිත් වීරසිරි යන අය විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත, 2020.01.21 දින ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත නිකුත් කර ඇති විනය දඬුවම ඉවත් කර දෙන ලෙසයි. එසේ නිකුත් කර ඇති විනය දඬුවම බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් නිකුත් කර ඇති 2019.08.10 දිනැති ලිපියේ සඳහන් වේ. එම නියෝගය අනුව, අභියාචක එවකට ඔහු දැරූ උප පොලිස් පරීක්ෂක තනතුරේ සිට පොලිස් සැරයන් තනතුර දක්වා පහත හෙලා ඇත. එකී නියෝගයට එරෙහිව අභියාචක විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇතත්, පොලිස් කොමිෂන් සභාව විසින් 2019.12.27 දිනැති ලිපිය මඟින් එම අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත.

ඉහත විනය නියෝගය නිකුත් කිරීමට හේතු වී ඇත්තේ, 2019.08.10 වන දිනැති ලිපිය මඟින් ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනාවකට, ඔහු වරදකරු බවට පත් කර තිබීමයි. එම චෝදනාව පහත දැක්වේ.

*අපකීර්තිදායක හැසිරීම.*

*උ.පො.ප. කහවලගේ රංජිත් වීරසිරි වන ඔබ පොලිස් සැරයන් 62882 ලෙස කළුතර උතුර පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරමින් සිටියදී සොරබඩු ළඟ තබා ගැනීමේ වරදට අත්අඩංගුවට ගෙන සිර මැදිරියේ රඳවා සිටි සැකකරු වූ අබ්දුල් රහීම් මොහොමඩ් රවුෆ් යන අයට, එම නඩු භාණ්ඩ පොලිසියට භාර දීම වැළැක්වීම සඳහා බලපෑම් කර, නඩුබඩු භාර නොදී සිටීමෙන් සැකකරුට නඩුවෙන් නිදහස් විය හැකි බව පවසා, පොලිස් විමර්ශනයට හානියක් වන අයුරින් ක්‍රියා කිරීම හේතුවෙන් එනම් ඔබ පොලිස් නිලධාරියෙකු වශයෙන්* ***අනිසි ලෙස හෝ විනය පවත්වා ගැනීමට හානි වන අන්දමින් හෝ පොලිස් සේවයේ හොඳ නමට කැළලක් විය හැකි අන්දමින් හැසිරීමෙන්*** *පොලිස් නියෝග ඒ 07 (බී) පරිශිෂ්ඨයේ විනය සංග්‍රහයේ 1 වන වගන්තිය යටතට ගැනෙන* ***"අපකීර්තිදායක ලෙස හැසිරීම"*** *යන වරද සිදුකර ඇති බවට ඔබට මෙයින් චෝදනා කරමි.*

ඉහත කී චෝදනාව සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, එම පරීක්ෂණය පැවැත්වූ නිළධාරියා අභියාචක එම වරදට වරදකරු බවට තීරණය කරමින් සඳහන් කර ඇත්තේ, චූදිත නිළධාරියා නඩු බඩු පොලිසියට ලබා නොදෙන ලෙසට, සැකකරුවකුට උපදෙස් ලබා දී අපරාධයක් වසන් කිරීම සඳහා ආධාර අනුබල ලබා දීමෙන් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ අපකීර්තිදායක හැසිරීම යන චෝදනාව ඔප්පු වී ඇති බවයි.

එසේ නම් මෙහිදී සළකා බැලිය යුතු වන්නේ, ඉහතින් සඳහන් කර ඇති විනය පරීක්ෂණය පැවැත්වූ නිළධාරියා විසින් ලබා දී ඇති තීරණයේ නිරවද්‍යතාවයයි. පරීක්ෂණ නිළධාරියා විසින් ඉදිරිපත් කර ඇති, 2019.01.18 දිනැති ලේඛණයෙහි(ගොනුවේ 166 පිටුව) අභියාචක වරදකරු කරන ලද්දේ, කුමන හේතූන් නිසා දැයි පැහැදිළි කර ඇත. එම වාර්තාවෙහි, ඔහු විසින් එක් එක් සාක්ෂිකරුවන් විසින් ලබා දී ඇති සාක්ෂි විශ්ලේෂණය කර ඇත. එම පරීක්ෂණයේදී ඉදිරිපත් වූ එක් සාක්ෂිකරුවකු හැරෙන්නට අනෙක් සියළුම සාක්ෂිකරුවන් පොලිස් නිළධාරීන්ය. එම එකම සාක්ෂිකරු වන්නේ, සිවිල් පුද්ගලයකු වන තිස්ස වීරසිංහ යන අයයි. පරීක්ෂණ නිළධාරියා එම සාක්ෂිකරුගේ සාක්ෂිය සළකා බලා, එම සාක්ෂියෙහි සම්පිණ්ඩනයක් ඉදිරිපත් කර ඇත. ඉහත කී තිස්ස වීරසිංහ යන අය විසින් ලබා දී ඇති සාක්ෂියට විනිශ්චය අධිකාරයේද අවධානය යොමු කරන ලදී.

ඉහත සඳහන් වීරසිංහ යන අය සාක්ෂි අංක 4 වශයෙන් නම් කර ඇති අතර, ඔහුගේ සාක්ෂි විධිමත් විනය පරීක්ෂණ වාර්තාවේ ඇතුළත් ගොනුවේ 76 පිටුවේ දක්නට ඇත. එම සාක්ෂිකරු හරස් ප්‍රශනවලට පිළිතුරු දෙමින් මෙසේ පවසා ඇත.

*ප්‍ර: සාක්ෂිකරු තමා විසින් පැ 04 ලේඛණයේ සඳහන් කර ඇති පරිදි කූඩුව ඇතුලේ සිටි පුද්ගලයින් රත්‍රං බඩු සම්බන්ධයෙන් කතා වුනේ කීයටද?*

*උ: හවස් වරුවේ. වෙලාවක් මම දන්නේ නැහැ.*

*ප්‍ර: ඒ කතා වුන කට්ටිය කූඩුවට දැම්මේ කීයටද?*

*උ: මාව දාන වෙලාවෙත් ඔවුන් කූඩුවේ හිටියා.*

හරස් ප්‍රශ්න වලට වැඩිදුරටත් මෙසේ පිළිතුරු දී ඇත.

*ප්‍ර: තමාගේ ප්‍රකාශයේ සඳහන් පරිදි කූඩුව ලඟට පැමින පොලිස් නිළධාරීන් මහතුන් බඩු දෙන්න එපා කියා කිව්වේ කීයටද?*

*උ: හවස් භාගයේ 04.00 ට පස්සේ වාගේ*

*ප්‍ර: සාක්ෂිකරු සමඟ 04 දෙනෙක් කූඩුවේ සිටි බව ප්‍රකාශ කළා. ඊට පසුව සැකකරුවන් කූඩුවට ගෙනවිත් දැම්මාද?*

*උ: එක් අයෙක්ව ඇක්සිඩන්ට් එකක් වෙලා ගෙනාවා ඊට පස්සේ ඔවුන්ට ඇප දීලා ඇරියා.*

*ප්‍ර: සාක්ෂිකරු තමාට ඇසුනු දෙය වෙන කාටවත් කිව්වාද?*

*උ: නැහැ මම වෙන කාටවත් කිව්වේ නැහැ.*

හරස් ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් ලබාදී ඇති එම සාක්ෂිය නොපිළිගැනීමට හේතුවක් නැත. විනය පරීක්ෂණය පැවැත්වූ නිළධාරියා විසින්ද ඔහු විසින් ගනු ලැබූ තීරණයට හේතු සඳහා එම කරුණ ඉදිරිපත් කර ඇත. මෙම සාක්ෂිකරු පොලිස් නිළධාරියකු නොවේ. එම අවස්ථාවේදී පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත්තේ ඉහත කී වීරසිංහ නැමැති සිවිල් පුරවැසියකුය. සාක්ෂි දී ඇති අනෙක් සාක්ෂිකරුවන් පොලිස් නිළධාරීන් නිසා අභියාචක පොලිස් නිළධාරීන්ට පක්ෂපාතීව හෝ අපක්ෂපාතීව සාක්ෂි දී ඇතැයි කෙනෙකුට තර්ක කළ හැක. නමුත් සිවිල් පුද්ගලයකු වන මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය කිසිඳු කෙනෙකුට පක්ෂපාතිව හෝ විරුද්ධව දුන් සාක්ෂි යැයි තර්ක කරමින්, ප්‍රතික්ෂේප කළ නොහැක. එවැනි තත්ත්වයක් යටතේ මෙම වීරසිංහ නැමැති සාක්ෂිකරුගේ සාක්ෂිය පිළිගත හැකි සාක්ෂියක් වශයෙන් තීරණය කළ යුතුය.

ඉහත සාක්ෂියට අමතරව, මෙම සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂි දී ඇති අනෙකුත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලටද, විනය පරීක්ෂණය පැවැත්වූ නිළධාරියා අවධානය යොමු කරමින්, අභියාචකට විරුද්ධව මෙම චෝදනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධීන් පිළිබඳව වන කරුණුද හොඳින් සළකා බලා ඇත. එම වාර්තාවෙහි 178 පිටුවෙහි පරීක්ෂණ නිළධාරියා සඳහන් කර ඇත්තේ, චූදිත

නිලධාරියා සහ අත්අඩංගුවට ගෙන සිටි සැකකරු වන මොහොමඩ් රවුෆ් යන අය පොලිස් සැරයන් 62882 වීරසිරි යන අභියාචකගේ බාප්පාගේ දුව සමඟ විවාහ වී ඇති බවයි. එවැනි තත්ත්වයක් යටතේ අභියාචක මෙම කරුණ සම්බන්ධයෙන් මැදිහත්වීම සඳහා සැලකිය යුතු හේතුවක් තිබීම සම්බන්ධයෙන්ද සාක්ෂි ඉදිරිපත්ව තිබූ බව පෙනී යයි.

ඉහත කරුණු සළකා බැලීමේදී පෙනී යන්නේ විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා ඔහුගේ තීරණයට අදාළ සාක්ෂි නියම ආකාරයෙන් පරීක්ෂා කර බලා නිවැරදි තීරණයකට එළඹී ඇති බවයි. එබැවින් අභියාචකට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝගය සම්බන්ධයෙන් මැදිහත්වීමට මෙම විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත.

ඉහත හේතූන් සළකා බලා මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි

(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි

(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්

(සාමාජික)

දෙව්මිනි/